# 1.30 ශ්‍රී ලංකාවේ සතර කෝරළයේ ප්‍රචලිත "බත් මාලාව" ශාන්තිකර්මය පිළිබඳ අධ්‍යයනයකි.

එස්.එම්. විජිත බණ්ඩාර
නාට්‍ය හා රංග කලා සහ ප්‍රතිබිම්බ කලා අධ්‍යයන ඒකකය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.

## ABSTRACT

ලාංකේය කෘෂි ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ සශ්‍රීකත්වය උදෙසා සිදුකරනු ලබන ශාන්තිකර්ම බොහොමයකි. උඩරට කොහොඹා කන්කාරිය, පහතරට දෙවොල් මඩුව හා සබරගමු පහන් මඩුව යන ප්‍රධාන ශාන්තිකර්ම ත්‍රිත්වයට අමතර ව ප්‍රාදේශීය වශයෙන් ව්‍යාප්තව පවතින අනුශාංගික ශාන්තිකර්ම ගණනාවකි. එයින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහව, ගල්ගමුව, අඹන්පොල, ගල්ටන් වැව, ඉහළගම, සංගප්පාලේ ආදී ප්‍රදේශයන් හි ප්‍රචලිත ව පවතින "බත් මාලාව" ශාන්තිකර්මය වූ කලි අලුත් සහල් මංගල්‍යය හා බැඳී විචිත්‍රවත් වූ මානව කලා හරඹයකි.

මහ කන්නයේ දී වී අස්වැද්දීමට ප්‍රථම ව ගම්බාර, පත්තිනි, අයියනායක, කඩවර, කම්බිලි හා අනෙකුත් දෙවියන් සහ යකුන් උදෙසා සිදුකරන බාරය, අස්වනු නෙලීමෙන් අනතුරු ව අක්යාල පුදා ඔප්පු දීම මෙහි දී සිදු කරනු ලබයි.

එහි දී ප්‍රථම අස්වැන්න දේව දානයක් ලෙස සකස් කොට ගොටු පුදා දෙවියන්ගේ අවසර ගෙන ඔවුන්ගේ ආශිර්වාදය මැද ගම් වැසියන් සමග භුක්ති විඳීම මෙහි දී දැකගත හැකි කටයුත්තකි. ගැමි ආගමත්, සාමූහිකත්වයත් සුසංයෝගයෙන් පවත්වනු ලබන්නා වූ "බත් මාලාව" වූ කලි ශාන්තිකර්මයකට වඩා මෙරට ගැමි ජනයාගේ ඓහලෞකික අතීන්ද්‍රිය ඥානය ස්පර්ශ කරන්නා වූ මානව ප්‍රපංචයක් බව සත්‍යයකි.

එබැවින් මෙම "බත් මාලාව" ශාන්තිකර්මය පිළිබඳ ව ශාස්ත්‍රීය ගවේෂණයක නියැලීම වූ කලි මෙරට ලාංකීය සංස්කෘතියේ නිලීනව යන මඩු චාරිත්‍රයකට ජීවය පිදීමකි.